**මධ්‍යම සංස්කෘතික අරමුදල - 2015**
**-----------------------------------**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 **විගණකගේ වගකීම**
**----------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු

----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ ඇතැම් ඉදිකිරීම් හා සංරක්ෂණ කටයුතු කොන්ත්‍රාත් පදනම මත ඉටුකිරීම වෙනුවෙන් සේවා ලබා ගැනීම සඳහා සී/ස සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම පිහිටුවා තිබුණි. 2015 වර්ෂයේදී අරමුදලේ ව්‍යාපෘති වැඩබිම්වල කැණීම් / සංරක්ෂණ සහායකයින් ලබා ගැනීම වෙනුවෙන් රු.මිලියන 81 ක්ද, ඉදිකිරීම් කොන්ත්‍රාත් වෙනුවෙන් රු. මිලියන 04 ක් ද එම සමාගමට ගෙවා තිබූ අතර අරමුදල හා සමාගම අතර පැවති සම්බන්ධතාවයේ ස්වභාවය හා සම්බන්ධිත ගනුදෙනු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අරමුදල යටතේ පවතින බටලීය අනුරු පාසල ඉදිකිරීමේ ටෙන්ඩරය සංස්කෘතික සංරක්ෂණ ඉදිකිරීම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට අයත් වෙනත් ඉදිකිරීම් සමාගමක් වෙත ලබාදී තිබුණද එම අධ්‍යක්ෂවරයා හා සමාගම අතර පැවති සම්බන්ධය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) අරමුදලේ අධ්‍යක්ෂවරයෙකු අධ්‍යක්ෂ ධූරය දරන වෙනත් පෞද්ගලික සමාගමක් වෙත රු.400,000 ක මූල්‍ය ආධාරයක් සිදුකර තිබුණද එම පෞද්ගලික සමාගම හා අධ්‍යක්ෂවරයා අතර සම්බන්ධතාවය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2

--------------------------------------------

වර්ෂය තුළ ආයෝජනය කළ රු.මිලියන 975 ක් සහ ආයෝජන ආපසු ගැනීම් රු.මිලියන 50 ක් පිළිවෙලින් මුදල් ගලායාමක් සහ මුදල් ගලාඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙන්වෙන්ව දක්වා නොතිබුණු අතර ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් රු. 46,761,998ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3

---

(i) ප්‍රමිතයේ ඡේද අංක 12 ප්‍රකාරව අරමුදලට අයත් නොවන පුරාවිද්‍යා කොමසාරිස් යටතේ භාරකාරත්වය දරන ප්‍රවේණිගත වත්කම් වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන ප්‍රාග්ධන වියදම් සම්බන්ධව ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණ අතර 2013 සහ 2014 වර්ෂ තුළදී දරන ලද රු. 60,215,604 ක් ගොඩනැගිලි, මාර්ග හා යටිතල ව්‍යුහයන් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ii) ප්‍රමිතයේ ඡේද අංක 54 ප්‍රකාරව ගිණුම්වල සිදු කරනු ලබන පෙර කාලපරිච්ඡේද දෝෂ ගැලපීම්වලට අදාළ වැරදි නිවැරදි කිරීම් පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමක් ලෙස වෙනස් කර සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද රු. 74,633,782 ක් වූ පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරුවලට කළ ගැලපීම් සමුච්චිත අතිරික්තයට ගලපා තිබුණ නමුත් ඒ පිළිබඳ තොරතුරු සටහන් මඟින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

---

(i) වටිනාකම රු.මිලියන 4 ක්වූ අරමුදලට අයත් ගොඩනැගිලි, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනයට ගනුලබන අතර ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 191.4 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද අපහරණය සඳහා පවතින වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ ඡේද අංක 87 ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ වල අයිතිය සම්බන්ධයෙන් පවතින බාධාවන් හා සීමාවන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වුවත් ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ අයිතියට ඇති සීමාවන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

- 2012 වර්ෂයේදී රු. මිලියන 4.2 කට තක්සේරු කර ගිණුම්ගත කර තිබූ අරමුදලේ දේපලක් වූ මහනුවර පිහිටි ප්‍රීම්රෝස් ඉඩමේ ප්‍රයෝජනාත්මක අයිතිය අරමුදල වෙත නොපැවතියදී මේ පිළිබඳව පවතින බාධාවන් හා සීමාවන් හෙළිදරව් කර නොතිබුණි.

- ආයතනයේ කතරගම සංචාරක බංගලාව ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු පර්චස් 40.25 ක ඉඩම වසර 50 ක කාලයක් සඳහා භෞතික භුක්තිය මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත පවරා තිබුණු අතර එම ඉඩම සම්බන්ධයෙන් ආයතනය සතු භෞතික භුක්තිය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අඩමාණ ණය වෙන් කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. වර්ෂ 5 කට වැඩි කාලයක සිට අයනොවන ණයගැති ශේෂද පැවතියදී ණය අයකර ගැනීමේ හැකියාව පිළිබඳ සමාලෝචනය කිරීමකින් තොරව ඉකුත් වර්ෂ දෙකෙහි මෙන්ම රු. 1,964,833 ක් සමාලෝචිත වර්ෂයේ අඩමාණ ණය ලෙස වෙන් කර තිබුණි.

(ආ) විදේශ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඒ අනුව ගිණුම් නොතැබීම හේතුවෙන් රු. 286,249,552 ක් ප්‍රාග්ධන ප්‍රදාන, ප්‍රාග්ධන හා සංචිත යටතේ ද රු. 13,174,223 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ජංගම නොවන වගකීම් යටතේ ද දක්වා තිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සීගිරිය ව්‍යාපෘතිය තුළ ශ්‍රී ලංකා රතු කුරුස සංවිධානය විසින් පවත්වාගෙන යන ප්‍රථමාධාර කඳවුර වෙනුවෙන් එම සංවිධානය වෙත 2015 වර්ෂය තුළ මුදලින් ගෙවා තිබූ රු. 4,294,901 ක් ප්‍රථමාධාර සේවා වියදම් ලෙස සටහන් නොකර ප්‍රචාරණ වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම රු. 285,596 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) අවසන් තොගයේ ඇතුළත් ප්‍රකාශන තොග රු. 141,380 ක්ද ගොඩනැගිලි ද්‍රව්‍ය තොගය රු. 1,777,694 ක්ද පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය රු. 141,402 ක්ද අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල බටලීය අනුරූ පාසල මඟින් ලබා දී තිබූ රු. 9,364,296 ක් වටිනා පරිත්‍යාග ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) පොළොන්නරුව උරුම නගරයේ ප්‍රවේශ මාර්ග ඉදිකිරීම වෙනුවෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවන ලද රු. 25,950,998 ක් කෙරීගෙන යන වැඩ ලෙස දැක්වීම වෙනුවට වර්ෂයේ ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

(ඊ) සේවක ණය හර ශේෂ, බැර ශේෂ සමඟ හිලව් කිරීම නිසා ආපදා ණය රු. 82,986 කින්ද, යතුරුපැදි ණය රු. 96,090 කින්ද අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වර්ෂය තුළ ගෙවූ රු. 1,423,226 ක අන්තර් ගෙවීම් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව ගොඩනැගිලි ක්ෂය රු. 71,161 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඌ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආයෝජන දෙකකට අදාලව පොලිය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් පොලී ආදායම සහ ලැබිය යුතු පොලිය රු. 1,678,504 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) අනුරු විකිණීම් අංශයේ ආදායම් සාරාංශ වාර්තා අනුව වර්ෂයේ විකුණුම් ආදායම රු. 8,850,461 ක් වුවද ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 11 අනුව එම ආදායම රු.7,127,634 ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ විකුණුම් ආදායම රු. 1,722,827 ක් අඩුවෙන් දක්වා තිබුණි.

## 2.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 7 වන වගන්තිය අනුව සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස කටයුතු කළ යුතුය. අරමුදල විසින් ලේකම්වරයාගේ සේවය වෙනුවෙන් මාසික වැටුපෙන් සියයට 33 1/3 ක් වූ මාසික දීමනාවක් ලෙස 2015 පෙබරවාරි සිට අගෝස්තු දක්වා රු. 140,791 ක්ද, 2013 සහ 2014 වර්ෂ තුළදී රු. 241,356 ක් බැගින්ද ගෙවා තිබූ අතර ඒ සඳහා ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 1.2 වගන්තිය ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවීමේ පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව පාලක මණ්ඩල අනුමැතියකින් තොරව කිසිදු කාර්යයක් ආරම්භ නොකළ යුතු වුවත් 2014 හා 2015 වර්ෂවලදී පාලක මණ්ඩල අනුමැතියකින් තොරව ප්‍රසම්පාදන සැලැස්මේ හෝ ක්‍රියාකාරි සැලැස්මේ හෝ අයවැය ලේඛනයේ ඇතුළත් නොවූ රු. 562,471,775 ක් වටිනා නව ඉදිකිරීම් සිදුකර තිබුණි.

(ඇ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 4 (ඇ) වගන්තියට පටහැනිව අයවැය ඇස්තමේන්තුවට පරිබාහිරව 2015 වර්ෂය තුළදී බටලීය අනුරු පාසල මඟින් රු. 4,449,852 ක් වටිනා අනුරු විවිධ පාසල්, පන්සල් හා රාජ්‍ය ආයතන වෙත පාලක මණ්ඩල අනුමැතියකින් තොරව නොමිලේ පරිත්‍යාග කර තිබුණි.

## 2.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවය හැරගිය සේවකයින් 35 දෙනෙකුගෙන් අයවිය යුතු ආපදා ණය රු. 1,670,016 ක්ද, සේවකයින් 5 දෙනෙකුගෙන් අයවිය යුතු නිවාස ණය රු. 841,288 ක්ද, සේවකයින් 5 දෙනෙකුගෙන් අයවිය යුතු යතුරුපැදි ණය රු. 336,369 ක්ද වර්ෂ 1 ත් 5 ත් අතර කාල පරාසයක් තුළ අයකරගෙන නොතිබුණි. තවද වර්ෂ 5 කට වැඩි උත්සව අත්තිකාරම් රු. 1,151,000 ක්ද, විශේෂ අත්තිකාරම් රු. 91,400 ක්ද අයකර ගෙන නොතිබුණ අතර එම ණයශේෂ අදාළ ඇපකරුවන්ගෙන් හෝ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ ණයගැති ශේෂය තුළ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු. 672,577 ක් වසර 4 කට අධික කාලයක සිට අයනොවී පැවතුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත | |
| | (i) 3 (2) (එ) වගන්තිය | සංස්කෘතික විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත්කර නොතිබුණි. |
| | (ii) 7 වන වගන්තිය | ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විය යුත්තේ සංස්කෘතික විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වුවත් සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන පරිපාලන නිලධාරි ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා කටයුතු කර තිබුණි. |
| (ආ) | 1998 අංක 24 දරන පනතින් සංශෝධිත 1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතේ 43 (අ) 1 හා 40 (ආ) වගන්ති | මෙම වගන්තිවලට පටහැනිව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව රු. 812,471,775 ක් වටිනා ව්‍යාපෘති 17 ක් ආරම්භ කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 104 හා 105 | දඹුල්ල ප්‍රකාශන ගබඩාවේ රු. 499,368 ක් වටිනා ප්‍රකාශන තොග ඌනතාවයක් ඇති වී වසර 5 කට අධික කාලයක් ගතවී ඇතත් ඒ සඳහා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 380(1) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ජංගම ගිණුම් 25 ක් ආරම්භ කර තිබුණි. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 4.3.1 හා 4.3.2 වගන්ති | සේවක රක්ෂණාවරණය ලබාගැනීම සඳහා මිලගණන් කැඳවීමට පෙර දැරිය යුතු වියදම් පිළිබඳව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.9,905,284 ක් වටිනා රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණි. |
| | (ii) 5.3.5 වගන්ති | වටිනාකම රු.මිලියන 46.4 ක් වූ බටලීය අනුරු පාසලේ පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ සී 5 ශ්‍රේණිය හෝ ඊට ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනැමිය යුතු වුවද ඊට පහළ ශ්‍රේණියක ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.1 හා 4.2.2 වගන්ති | මසකට වරක් පාලක මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ පාලක මණ්ඩල රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 867,115,251 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 479,462,969 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 387,652,282 කින් එනම් සියයට 80.8 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම රු. 550,917,864 කින් වැඩිවීම, ආයෝජන ආදායම රු. 18,523,725 කින් වැඩිවීම, විකුණුම් ප්‍රවර්ධනය හා මහජන සම්බන්ධතා වියදම් රු. 52,947,362 කින් අඩුවීම හා වෙනත් වියදම් රු. 127,454,242 කින් අඩුවීම ඉහත වර්ධනයට මූලික වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයෙන් පසු මූල්‍ය අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු. 807,979,481 ක් වූ දායකත්වය ක්‍රමිකව වර්ධනය වී 2015 වර්ෂයේදී රු. 1,966,952,196 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත අනුව අරමුදලේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

* සංස්කෘතික ත්‍රිකෝණය තුල ඇති සංස්කෘතික ස්මාරක සහ වෙනත් ප්‍රදේශයක සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීම.
* ජේතවන දාගැබ යෝජනා ක්‍රමයෙහි හා වෙනත් යෝජනා ක්‍රමයන්හි සියලු වියදම් පියවීම.
* ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ආගමික කටයුතු ප්‍රවර්ධනය.
* ආගම නංවාලීම හෝ ආගමික ස්ථාන පවත්වාගෙන යාම.
* සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රයට සේවය කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් පිරිනැමීම.
* කලා කටයුතු සඳහා ආධාර ලබාදීම.
* මහජනයාට ප්‍රතිලාභයක් සැලසෙන වෙනත් ආගමික හෝ සංස්කෘතික කාර්යයන් සඳහා අරමුදල් යෙදවීම

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව හා අරමුදල විසින් අලෙවි කළ සංචාරක ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව අතර විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂය | ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව | අරමුදල විසින් අලෙවිකළ සංචාරක ප්‍රවේශපත්‍ර ප්‍රමාණය | අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සංචාරකයින්ට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස | ප්‍රවේශපත්‍ර ආදායම |
|---|---|---|---|---|
| ------- | ----------------------- | ---------------------------- | -------------------------------- | ----------- |
| | | | | රු. |
| 2013 | 1,274,593 | 504,699 | 39 | 1,748,439,894 |
| 2014 | 1,527,153 | 627,136 | 41 | 2,200,143,813 |
| 2015 | 1,798,380 | 722,676 | 40 | 2,751,061,677 |

ඉහත තොරතුරු අනුව 2013, 2014 හා 2015 වර්ෂ තුළ ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාවට සාපේක්ෂව අරමුදල විසින් අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 39, සියයට 41 හා සියයට 40 ක් විය. ඒ අනුව පෞරාණික සංස්කෘතික නටඹුන් සහිත ස්ථාන නැරඹීම හා ආගමික කටයුතු ප්‍රවර්ධනය සඳහා සංචාරකයින් ආකර්ෂණය කරගැනීමට අලෙවි ප්‍රවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ආදායම් වර්ධනය කර ගැනීමට කළමනාකරණය විසින් අවධානයක් යොමුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමස්ත ආයතනය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර කැණීම් හා සංරක්ෂණ ව්‍යාපෘති සඳහා පමණක් වැඩ සැලැස්මක් පිළියෙල කර තිබුණද ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. එම සැලැස්මට අනුව ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව කැණීම් හා සංරක්ෂණ ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ද්‍රව්‍ය පිරිවැය රු. 234,399,062 ක් හා සෘජු ශ්‍රම පිරිවැය රු. 468,357,144 ක් වූ කැණීම් හා සංරක්ෂණ වැඩබිම් 303 කට අදාළව වැඩ සම්පූර්ණයෙන් නිම කිරීමට සැලසුම් කර තිබුණද වැඩබිම් 53 ක් පමණක් නිමකර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඇස්තමේන්තුගත ද්‍රව්‍ය පිරිවැයෙන් සියයට 24 ක් සහ ඇස්තමේන්තුගත සෘජු ශ්‍රම පිරිවැයෙන් සියයට 95 ක් තත්‍ය වශයෙන් වැයකර තිබීම හේතුවෙන් සමස්ත කාර්යසාධනය ශ්‍රමය වෙනුවෙන් ඉහළ දායකත්වය ගෙන තිබුණද අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී වැඩබිම් 303 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබූ අතර එයින් සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු. 40,452,278 ක් වූ කැණීම් හා සංරක්ෂණ වැඩබිම් 28 ක කටයුතු ආරම්භ කර නොතිබුණි.

(iii) ව්‍යාපෘති 12 ක් යටතේ කැණීම් සංරක්ෂණ වැඩබිම් 20 ක වැඩ ඒකක 20,331 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිම කිරීමට සැලසුම් කර ඒ සඳහා රු. 72,711,268 ක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙයින් වැඩ ඒකක 1,896 ක් පමණක් නිමකර ඒ සඳහා රු. 7,447,154 ක් වැයකර තිබීම හේතුවෙන් භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් සියයට 9 ක් හා සියයට 10 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රකාශන තොග අවශ්‍යතාවය පිළිබඳ විධිමත් ඇගයීමක් නොකර ප්‍රකාශකයින්ගෙන් පොත් මිලදී ගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගයෙහි ඇති රු. 10,438,073 ක් වටිනා ප්‍රකාශන වර්ෂ 10 කට වැඩි කාලයක සිට අලෙවි නොවී පැවති අතර එම ග්‍රන්ථ ඉවත් කිරීමට හෝ අලෙවි කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) ඉදිකිරීම් සඳහා උපදේශක සේවා සැපයීමේදී වාස්තු විද්‍යා උපදේශක විසින් ව්‍යුහ සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍ර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටුව තුළ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, ගෙවීම් පිළිබඳ පරීක්ෂා කිරීම, කර්මාන්ත අධීක්ෂණය හා සංරක්ෂණ අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම ආදී සියලු කටයුතු සිදුකර තිබුණු අතර ඒ අනුව මනා වැඩ බෙදීම් ක්‍රමවේදයක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය අපොහොසත්ව තිබුණි.

(ඇ) අරමුදලේ රසායනාගාර හා ප්‍රකාශන අංශයේ නොපියවූ අත්තිකාරම් තුළ 2013 වර්ෂයේ සිට හඳුනානොගත් ආරම්භක ශේෂ ලෙස දක්වා ඇති රු. 770,700 ක් වටිනා ශේෂ 2015 දෙසැම්බර් 31 දින වනවිටත් හඳුනාගෙන පියවීම සඳහා කටයුතු කර නොතිබුණි.

4.3 **මෙහෙයුම් ක්‍රියාකාරකම්**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බටලීය අනුරු පාසලේ සමාලෝචිත වර්ෂයේ සමස්ත වියදම රු. 34,830,911 ක් වූ අතර මුළු ආදායම රු. 8,850,461 ක් වූයෙන් රු. 25,980,450 ක අලාභයක් ලබා තිබුණි.

(ආ) ප්‍රවේශපත් අලෙවිසැල් වලදී විදේශීය ප්‍රවේශපත්‍රවල වටිනාකම දේශීය මුදලට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ප්‍රවේශපත් අලෙවි කරන අවස්ථාවේදී කුවිතාන්සි නිකුත් නොකිරීම.

(ii) විදේශ විනිමය ගනුදෙනු සඳහා විදේශ විනිමය ගිණුමක් පවත්වා ගැනීම තුළින් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර රැස් කරගන්නා විදේශ විනිමය දෛනිකව දේශීය ගිණුමක තැන්පත් කිරීම නිසා විදේශ විනිමය අලාභයක් සිදුවීම.

(iii) ප්‍රවේශපත්‍රයක විදේශ විනිමය වටිනාකම දේශීය මුදලට පරිවර්තනය කිරීමේදී නිසි ක්‍රමවේදයක් භාවිතා නොකිරීම එනම්, විදේශ විනිමය හුවමාරු අනුපාතය පිළිබඳව නියෝග ප්‍රධාන කාර්යාලය විසින් ලබාදීමේදී එය කාලානුරූපීව සමාලෝචනය කිරීමකින් තොරව නියෝග ලබා දී තිබුණු අතර 2015 වර්ෂය තුළ එසේ ලබාදුන් නියෝග ගණන 02 ක් පමණක් වීම.

(iv) ප්‍රධාන කාර්යාලය විසින් 2015 වර්ෂය තුළ ලබාදුන් නියෝග අනුව විදේශ විනිමය විකුණුම් අනුපාතය මත අරමුදල විසින් ගිණුම්ගත කර තිබූ විදේශ ප්‍රවේශපත්‍ර අලෙවි වටිනාකම සහ මාසික විදේශ විනිමය විකුණුම් අනුපාතය පදනම් කරගෙන විගණනය විසින් ගණනය කළ වටිනාකම අතර රු. 25,455,799 ක වෙනසක් නිරීක්ෂණය විය.

(v) දෛනිකව විදේශ විනිමය විකුණුම් අනුපාත මත ප්‍රවේශපත්‍රවල විදේශ විනිමය වටිනාකම දේශීය මුදලට පරිවර්තනය කිරීම තුළින් අලෙවි ආදායම වැඩිකර ගැනීමට ක්‍රියා නොකිරීම.

4.4 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **සේවක රක්ෂණ ආවරණ ලබාගැනීම.**

-------------------------------------------

(i) සේවකයින් 936 ක් සඳහා රක්ෂණ ආවරණ ලබාගැනීමට අරමුදල විසින් රු. 9,905,284 ක් (බදු සහිත) ගෙවා තිබූ අතර රක්ෂණ ආවරණ ලබාගැනීමට කැමැත්ත පල නොකළ සේවකයින් 432 දෙනෙකු වෙනුවෙන් ගෙවූ රු. 4,571,670 ක්ද එම වියදම් තුළ ඇතුළත් වී තිබුණි. තවද අවදානම් සහිත කාර්යයන්හි නිරතවන සේවකයින් රක්ෂණය කිරීමේ අරමුණෙන් මෙම රක්ෂණාවරණ ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණද ඔවුන්ගෙන් සුළු පිරිසක් පමණක් රක්ෂණාවරණය ලබා ගැනීම සඳහා දායක වී තිබුණි.

(ii) 2009 සැප්තැම්බර් 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/437 අනුව රාජ්‍ය ආයතන සඳහා රක්ෂණ ආවරණයන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් හෝ ජාතික රක්ෂණභාර අරමුදලෙන් පමණක් ලබාගත යුතු බව දක්වා තිබියදී ඊට පටහැනිව අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රතික්ෂේප කර පුද්ගලික රක්ෂණ සමාගමකට රු. 9,905,284 ක් ගෙවා සේවක වෛද්‍ය රක්ෂණ ආවරණය ලබාගැනීමට කටයුතු කර තිබුණි. අඩුම මිල ගණන් ඉදිරිපත් කළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රක්ෂණාවරණය ලබාගන්නා ලෙස අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කළ නිර්දේශ පිළිබඳව මෙහිදී කළමනාකරණය විසින් කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(iii) රක්ෂණ සමාගම වෙත සාවද්‍ය නාමලේඛනයක් ඉදිරිපත් කර සේවකයින් 50 දෙනෙකුගේ නම් වැඩිපුර ඇතුළත් කර ඒ සඳහා රු. 475,000 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එම මුදල් අදාළ නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2015 අප්‍රේල් 01 සිට 2015 ඔක්තෝබර් 31 දක්වා සේවක වැටුපෙන් අයකර ගතයුතු මාසික රක්ෂණ වාරිකය රු.1,118,376 ක් වුවද ඉන් රු.299,882 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

(ආ) ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් 2015 මාර්තු 28 දින සංස්කෘතික හා කලා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා හා පළාතේ දේශපාලන අධිකාරියේ සහභාගීත්වයෙන් සංස්කෘතික හා කලා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ වැඩසටහනක් සඳහා පළාතේ ගර්භනී කාන්තාවන් දහසකට චීත්ත රෙදි හා කුඩා මදුරුදැල් ලබාදීම වෙනුවෙන් ආයතනය රු. 722,500 ක් අරමුදලේ අරමුණුවලට පටහැනිව වැයකර තිබුණි.

4.5 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

ප්‍රයෝජනයට නොගන්නා ආයතනය සතු වාහන 08 ක් සම්බන්ධයෙන් 2015 ඔක්තෝබර් 06 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු නොකර කොළඹ, බෞද්ධාලෝක මාවතේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ හා කොළඹ, කුරුඳුවත්තේ පිහිටි අතපත්තු කාර්යාලයේ අනාරක්ෂිතව නවතා තිබුණි.

4.6 **රාජ්‍ය ආයතන හා වෙනත් බාහිර පාර්ශවයන් වෙත ලබාදුන් අරමුදලේ සම්පත්**

-----------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 සිට 2014 වර්ෂය දක්වා තිස්සමහාරාමය හා අභයගිරි ව්‍යාපෘතිය සතු GI බට 664 ක්, කප්ලින් 1308 ක් හා GI තහඩු 19 ක් විවිධ පූජනීය ස්ථාන සහ විවිධ රාජ්‍ය ආයතන වෙත ලබාදී තිබුණද මෙතෙක් ආපසු ලබාගෙන නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 8.3.9 ඡේදය අනුව ආයතනය සතු සම්පත් රේඛීය අමාත්‍යාංශය හෝ බාහිර ආයතනවලට ලබා නොදිය යුතු වුවද ඊට පටහැනිව ආයතනයේ සේවකයින් තිදෙනෙකු අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සේවය සඳහා යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එම සේවකයින් වෙත වැටුප් හා දීමනා ලෙස රු. 1,834,645 ක් ගෙවා තිබූ අතර හිටපු අමාත්‍යවරයා වෙත 2012 ජූලි සිට 2015 අගෝස්තු දක්වා ඩබල් කැබ් රථයක්ද ලබා දී තිබුණි.

4.7 **කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා අනුමත සේවක සංඛ්‍යාව හා 2015 දෙසැම්බර් 31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව සැලකීමේදී ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ද්විතියික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 2 ක්, 8 ක්, හා 50 ක් හා ප්‍රාථමික මට්ටමේ අතිරික්ත සේවක සංඛ්‍යාව 1010 ක් විය. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පුරාවිද්‍යා හා වාස්තු විද්‍යා උපදේශක තනතුරු සඳහා පුද්ගලයන් 05 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

4.8 **ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බටලීය අනුරු පාසලේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ටෙන්ඩරය පෞද්ගලික සමාගමක් වෙත රු.මිලියන 46.4 කට ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) සියලු සුදුසුකම් සම්පූර්ණ කළ අවම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කර උපරිම මිලට ටෙන්ඩරය පිරිනැමීම හේතුවෙන් අරමුදලට සිදු වූ අලාභය රු. 3,036,382 ක් විය.

(ii) විගණිත දින එනම් 2016 අප්‍රේල් 25 වනවිට ගිවිසුම්ගත කාල සීමාව ඉක්මවා මාස 12 ක් ගතවී තිබුණද අත්තිවාරම පමණක් ඉදිකර තිබුණි.

(ආ) උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි (2007 අගෝස්තු) 3.6 හා 5.1.1 වගන්ති වලට පටහැනිව වාස්තු විද්‍යා උපදේශකවරයෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගෙන 2013 ජූලි 01 දින සිට 2016 මාර්තු 31 දින දක්වා රු. 33,748,306 ක් ගෙවීම් කර තිබුණි. තවද 2014 ජූලි 01 සිට 2016 මාර්තු 31 දින දක්වා ගෙවීම් කිරීම සඳහාද පාලක මණ්ඩල අනුමැතියක් ලැබී නොතිබුණි.

(ඇ) උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි (2007 අගෝස්තු) 3.6 හා 5.1.1 වගන්තිවලට පටහැනිව බටලීය අනුරු පාසලේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගම වෙත රු. 2,000,000 ක මුදලක් උපදේශන සේවා ගාස්තු ලෙස ගෙවීම් කර තිබුණි. එසේ වුවද එම සමාගම විසින් ඉදිකිරීම් වලට අදාළව සැලසුම්, ප්‍රමාණපත්‍ර හා ව්‍යුහ සැලසුම් කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) රුවන්වැලි සෑ නව පෙත්මග ඉදිකිරීම පිළිබඳ භෞතික පරීක්ෂාවේදී අදාළ මිනුම් ලබා ගැනීමකින් හෝ මිල විශ්ලේෂණයකින් තොරව පහත සඳහන් පරිදි ගෙවීම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

| වැඩ විෂයය | ගෙවිය යුතු මුදල | ගෙවූ මුදල | වැඩිපුර ගෙවූ මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කාණු සහ බෝක්කු 05 ක් සකස් කිරීම | 188,055 | 2,500,000 | 2,311,945 |
| Drop inlet 08 ක් සකස් කිරීම. | 400,000 | 400,000 | - |
| අඩි 03 ක් දිග තියුම් පයිප්ප බටයක් හා 0.450 x 0.450 x 0.100 mm ප්‍රමාණයේ කොන්ක්‍රීට් වලක් සකස් කිරීම. | 26,945 | 400,000 | 373,055 |
| එකතුව | | | 2,685,000 |

5. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

5.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දින 174 ක් ප්‍රමාද වී 2016 අගෝස්තු 22 දින ඉදිරිපත් කර තිබුණි.

5.2 **සංයුක්ත සැලැස්ම**

සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි 2013 – 2016 කාලපරිච්ඡේදය සඳහා උපායමාර්ග සැලැස්මක් පිළියෙල කර තිබුණද එය කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

5.3 **ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා කැණීම් හා සංරක්ෂණ ව්‍යාපෘති සඳහා වැඩ සැලැස්මක් පමණක් සකස් කර තිබූ අතර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.4 **ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම පාලක මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි.

5.5 **වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2013 හා 2014 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2017 මාර්තු 31 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.6 අයවැය ලේඛනමය පාලනය

2015 වර්ෂයට අදාළ අයවැය ලේඛනය එම වර්ෂයේ නොවැම්බර් මාසයේදී පිළියෙල කරතිබූ අතර ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 5.7 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය කි.මී. 1 ක් දුරට කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීමේ කාර්යය වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමක් වෙත රු. 28,255,312 ක් ගෙවා තිබූ අතර ඒ සම්බන්ධයෙන් 2012 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන් පහත සඳහන් අඩුපාඩු සම්බන්ධයෙන් මේ දක්වාම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- (i) නිසි ප්‍රමිතියට නොමැති කොන්ක්‍රීට් කුට්ටි ගල් ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගෙන ඒ වෙනුවෙන් රු. 22,099,917 ක් ගෙවා තිබීම.
- (ii) ප්‍රමාණපත්‍රය අනුව ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු. 4,660,998 ක් ගෙවීම.
- (iii) ABC ස්ථරය සියයට 40 ක් හා ගල්කුඩු මිශ්‍රණය සියයට 50ක් අඩුවෙන් යොදා තිබීම.
- (iv) මාර්ගය සමතුලිතතාවයෙන් තොරවීම.

(ආ) පොළොන්නරුව පූජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට ඇති මාර්ගය කි.මී. 01 ක් දුරට කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා වැඩි දියුණු කිරීමේ කාර්යය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු. 27,500,000 කට පවරා ඒ වෙනුවෙන් රු. 29,235,510 ක් ගෙවීම් කර තිබුණි. එයට අදාළව පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

- (i) ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා තාක්ෂණ ඇගැයීම් කමිටුවේ නිර්දේශය ලබා නොගැනීම.
- (ii) අනුමැතියෙන් තොරව පාරේ පළල වැඩි කිරීම.
- (iii) ප්‍රමිතියෙන් තොරව කටයුතු කිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත මුදල රු. 48,575,893 ක් දක්වා ඉහළ යාම.
- (iv) නිසි ප්‍රමිතියට නොමැති කොන්ක්‍රීට් කුට්ටි ගල් යොදාගෙන ඉදිකිරීම් කටයුතු කිරීම හා ඒ වෙනුවෙන් රු. 16,992,545 ක් ගෙවා තිබීම.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සම්බන්ධයෙන් වරින්වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | රජයේ ප්‍රදානයන් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම්ගත කර නොතිබීම. |
| | | (ii) | විදේශ විනිමය ගනුදෙනු දේශීය මුදලට පරිවර්තනයේදී නිවැරදි අනුපාත භාවිතා කර නොතිබීම. |
| | | (iii) | සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු හෙළිදරව් නොකිරීම. |
| | | (iv) | නිෂ්පාදන ගිණුම් පිළියෙල කර නිවැරදි නිෂ්පාදන පිරිවැය හඳුනාගෙන නොතිබීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලයක සිට ඇතැම් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් සේවයේ යෙදවීම. |
| | | (ii) | සේවකයින්ගේ අවශ්‍යතා සලකා බැලීමකින් තොරව සේවක රක්ෂණ ආවරණ ලබාගැනීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | (i) | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබීම. |
| | | (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම. |
| | | (iii) | ඉදිකිරීම් නිශ්චිත කාල රාමුවක් තුල ඉටුකරවා නොගැනීම. |
| (ඈ) | අරමුදල් කළමනාකරණය | (i) | විදේශ විනිමය ගනුදෙනු සඳහා විදේශ විනිමය ගිණුමක් පවත්වා නොගැනීම. |
| | | (ii) | කෙටිකාලීන තැන්පතුවල අරමුදල් ආයෝජනය කිරීම. |
| (ඉ) | ණයගැති පාලනය | (i) | දිගුකලක සිට පවතින ණයශේෂයන් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | අඩමාන ණය වෙන්කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන ඒ අනුව වෙන්කිරීම් සිදු නොකිරීම. |
| (ඊ) | තොග පාලනය | (i) | නියමිත දිනට තොග සමීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් නොකිරීම. |
| | | (ii) | ප්‍රවේශපත් තොග මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව දක්වා නොතිබීම. |
| (උ) | වත්කම් කළමනාකරණය | | දේපළ, පිරියත හා උපකරණ සඳහා වත්කම් හඳුනා ගැනීමේ සංකේත අංක, වත්කම් අයත් ස්ථානය ආදි කරුණු ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛනය නිසිපරිදි නඩත්තු කර නොතිබීම. |